“ඔබට සැක ඇති කරන දෑ, ඔබට ඒ ගැන සැක ඇති නොවන තෙක් අත්හැර දමන්න. සැබැවින්ම සත්යය සැනසුමකි. අසත්ය සැකය උපදවන්නකි

අබූ අල්-හව්රා අස්-සඃදී තුමා විසින් වාර්තා කරන ලදී. මම හසන් ඉබ්නු අලී (රළියල්ලාහු අන්හුමා) තුමාගෙන්, 'ඔබ අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ලබා ඇත්තේ කුමක්දැ?'යි විමසා සිටියෙමි. හෙතෙම 'මම අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ලබා ඇති දෑ මෙසේය යැ'යි පවසා සිටියහ: “ඔබට සැක ඇති කරන දෑ, ඔබට ඒ ගැන
සැක ඇති නොවන තෙක් අත්හැර දමන්න. සැබැවින්ම සත්යය සැනසුමකි. අසත්ය සැකය උපදවන්නකි." [صحيح] [رواه الترمذي والنسائي وأحمد]

ඔබට සැක ඇති කරන ප්රකාශ හා ක්රියා අත්හැර දමන ලෙස නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. එය තහනම් කරනු ලැබූ දෙයක් වුවද එසේ නැති වුව ද, එය තහනම් ද අනුමත ද යන්න ගැන සැකයක් පහළ වූ විට, එහි යහපත හා අනුමත භාවය ස්ථීර වී සැකයක් නැති තාක් එය අත්හැරිය යුතු ය. එමගින් සිත සන්සුන් වී සැනසුමට පත්වේ. කවර කරුණක සැකය ඇත්තේ ද එමගින් හදවත කලබලකාරී තත්ත්වයට පත්වන අතර එහි කුතුහලය ඇති වේ.

http://www.sunnah.global/hadeeth/si/show/4564